ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2015.01.01 |

## වයස අවුරුදු පනස් පහට වැඩි පුද්ගලයන්ගේ තැන්පතු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වලින් ගෙවිය හැකි උපරිම පොළී අනුපාත

2015 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, වයස අවුරුදු පනස් පහට (55) වැඩි පුද්ගලයෙකු විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල කරනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන ඉතුරුම් තැන්පතු සහ බාර ගනු ලබන හෝ කල්පිරීමෙන් පසු නැවත ආයෝජනය කරනු ලබන කාලීන තැන්පතු සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති උපරිම පොළී අනුපාතයන්ට වඩා ප්‍රතිශත අංක දෙකක අතිරේක පොළියක් ගෙවිය හැකි බව මහජනයා වෙත මෙමගින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව, වයස අවුරුදු පනස් පහට (55) වැඩි පුද්ගලයින් සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ගෙවිය හැකි උපරිම තැන්පතු පොළී අනුපාත පහත දැක්වේ.

අ. බාර ගනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන ඉතිරිකිරීමේ තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොළී අනුපාතය 9.58% කි.

ආ. බාර ගනු ලබන හෝ කල්පිරීමෙන් පසු නැවත ආයෝජනය කරනු ලබන කාලීන තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොළී අනුපාත;

i. කල්පිරීමේ කාලය වසරක් හෝ ඊට අඩු තැන්පතු සඳහා වාර්ෂිකව 13.01% කි.
ii. කල්පිරීමේ කාලය වසරකට වැඩි සහ වසර 3 ක් දක්වා තැන්පතු සඳහා වාර්ෂිකව 14.01% කි.
iii. කල්පිරීමේ කාලය වසර 3 ට වැඩි තැන්පතු සඳහා වාර්ෂිකව 15.51% කි.